**ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය**

**කොළඹ**

***

**<u>පුවත්පත් නිවේදනය</u>**

**<u>නියෝජ්‍ය මහ කොමසාරිස්තුමා දකුණු පළාතේ සංචාරයක නිරත වේ</u>**

නියෝජ්‍ය ඉන්දීය මහ කොමසාරිස් විනෝද් කේ. ජේකබ් මහතා 2021 මාර්තු 17-18 යන දෙදින ශ්‍රී ලංකාවේ දකුණු පළාතේ සංචාරයක නිරත විය. හම්බන්තොට ඉන්දියානු කොන්සියුලර් ජෙනරාල් පී. ආර්. ඩිපින් මහතා ද මෙම සංචාරයට එක් විය. සිය සංචාරය අතරතුරදී නියෝජ්‍ය මහ කොමසාරිස්තුමා කතරගම දේවාලය වැඳ පුදා ගත් අතර කිරි වෙහෙර රජමහා විහාරස්ථානයේ සහ අභිනවාරාම විහාරස්ථානයේ විහාරාධිපති ස්වාමීන් වහන්සේලා බැහැදැක උන්වහන්සේලාගේ ආශිර්වාදය ලබා ගත්තේය. නියෝජ්‍ය මහ කොමසාරිස්තුමා කතරගම දේවාලයේ බස්නායක නිලමේ ඩිෂාන් ගුණසේකර මහතා සමඟ සාකච්ඡාවක නිරත වූ අතර එහිදී එතුමා 2020 සැප්තැම්බර් මස 26 වන දින අන්තර්ජාලය ඔස්සේ පැවති ද්විපාර්ශවික සමුළුවේදී ඉන්දියාව සහ ශ්‍රී ලංකාව අතර බෞද්ධ සබඳතා ප්‍රවර්ධනය කිරීම සඳහා අග්‍රාමාත්‍ය ශ්‍රී නරේන්ද්‍ර මෝදි මැතිතුමා විසින් ප්‍රකාශයට පත් කරන ලද ඇමරිකානු ඩොලර් මිලියන 15ක ප්‍රදානය සම්බන්ධයෙන් බස්නායක නිලමේතුමා දැනුවත් කළේය. මෙය ඉන්දියාව විසින් ප්‍රකාශයට පත් කරන ලද එවන් පළමු ප්‍රදානය බව සිහිපත් කළ නියෝජ්‍ය මහ කොමසාරිස් ජේකබ් මහතා ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය සහ බුද්ධ ශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය මෙම ප්‍රදානය යටතේ ක්‍රියාත්මක කළ හැකි විවිධ ව්‍යාපෘතීන් හඳුනාගැනීමට කටයුතු කරමින් සිටින බව ප්‍රකාශ කළේය.

නියෝජ්‍ය මහ කොමසාරිස්තුමා මාර්තු 17 වන දින දකුණු පළාත් ආණ්ඩුකාර ගරු විලී ගමගේ මහතා ආණ්ඩුකාර ලේකම් කාර්යාලයේදී හමු වී පසුගිය වසර තුළ සංවර්ධන සහයෝගීතාවය, තාක්ෂණික සහයෝගීතාවය, සෞඛ්‍යය, අධ්‍යාපනය සහ වෙනත් ක්ෂේත්‍රයන්හි ඉන්දු-ශ්‍රී ලංකා සහයෝගීතාවය සම්බන්ධයෙන් සාකච්ඡා පැවැත්වීය. එතුමා ඉන්දීය ආධාර යටතේ ඉදිකරන ලද රුහුණ විශ්ව විද්‍යාලයීය රවින්ද්‍රනාත් තාගෝර් අනුස්මරණ ශ්‍රවණාගාරය වෙත ද ගිය අතර එම විශ්ව විද්‍යාලයේ උප කුලපති මහාචාර්ය සුජීව අමරසේන මහතා සමඟ ඵලදායි සාකච්ඡාවන්හි නිරත විය.

මෙම සංචාරය අතරතුරදී නියෝජ්‍ය මහ කොමසාරිස් ජේකබ් මහතා ශ්‍රී ලංකා නාවික හමුදාවේ දක්ෂිණ විධානයේදී ශ්‍රී ලංකා නාවික හමුදාවේ දකුණු නාවික හමුදා ප්‍රදේශය භාර

අණදෙන නිලධාරී CMDE යූ. වී. එම්. පී. පෙරේරා මහතා හමු විය. එසේම එතුමා දකුණු පළාතේ ප්‍රධාන ලේකම් ආර්. සී. ද සොයිසා මහතා දකුණු පළාත් ප්‍රධාන ලේකම් කාර්යාලයේදී හමු විය. නියෝජ්‍ය මහ කොමසාරිස්තුමා දකුණු පළාතේ ක්‍රියාත්මක ඉන්දියානු නිවාස ව්‍යාපෘතියේ ප්‍රගතිය නිරීක්ෂණය කළ අතර ඉන්දීය ප්‍රදාන යටතේ තිස්සමහාරාමයේ ඉදි කර තිබෙන ශිල්ප කලා භූමිය වෙත ද ගියේය.

***

කොළඹ
2021 මාර්තු 19